Nestlé
Good Food, Good Life

Nestlé Lanka PLC News Release

Colombo: 6 April 2016

# <u>මැගී මේ අවුරුදු සමයේ ශ්‍රී ලාංකික ගෘහණියන් සවිබල ගන්වයි</u>

ජනප්‍රියතම ආහාර වෙළෙඳනාමයක් වන මැගී වසර 30ක් පුරා ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන්ගේ විශ්වාසය දිනාගෙන ඇත. මෙම උත්සව සමයේදී සම්ප්‍රදායික අවුරුදු ආහාර සෑදීමේදී ශ්‍රී ලාංකික ගෘහණියන් සවිබලගැන්වීමට මැගී කටයුතු කර තිබේ.

ස්වර්ණවාහිනී රූපවාහිනී නාළිකාව සමග ඉදිරිපත් කරන ‘මැගී සමග අවුරුදු කෑම’ වැඩසටහන මගින් ගෘහණියන්ට රසවත්ව අවුරුදු ආහාර පාන සාදාගැනීමට දැනුම ලබාදෙනු ඇත. සම්ප්‍රදායික අවුරුදු ආහාර සෑදීම සඳහා යොදාගත හැකි නිපැයුම් පෙළක්ම මැගී සතු වේ. ශ්‍රී ලංකාවේ වැවෙන උසස් තත්ත්වයේ නැවුම් පොල් යොදාගෙන නිපදවන ‘මැගී පිටි කළ පොල් කිරි’ යොදා ගනිමින් කිරිබත් කොකිස් වැනි අවුරුදු ආහාර සහ රසකැවිලි සාදාගැනීමට හැකියාව තිබේ. අවුරුදු සමයේ නිවසට පැමිණෙන නෑදෑ හිතමිතුරන් වෙනුවෙන් රසවත්ව බත් සහ ව්‍යාංජන පිළිගැන්වීමට ‘මැගී රසමුසු’ වඩාත් පහසු විසඳුමක් ලබා දෙයි.

ශ්‍රී ලංකාව පුරා තෝරාගත් නගරවලදී පාරිභෝගිකයින් ඇගයීමට සහ ඔවුන්ට වටිනා ත්‍යාග ලබාදීම වෙනුවෙන් මැගී විසින් සුවිශේෂී අවුරුදු ක්‍රීඩා සංවිධානය කිරීම මෙන්ම එහිදී මැගී නිෂ්පාදන ආහාරයට සකස්කර ලබාදීමද සිදු වේ.

මැගී මේ වන විට පරම්පරා කිහිපයක පාරිභෝගිකයින් වෙනුවෙන් රසයෙන් මෙන්ම යහගුණයෙන් පරිපූර්ණ ආහාර විසඳුම් ලබා දී තිබේ. ශ්‍රී ලාංකික ජනතාව මැගී කෙරෙහි තබා ඇති විශ්වාසය මැනවින් පැහැදිලි කරමින් පසුගියදා පැවැති ස්ලිම් (SLIM) - නීල්සන් ජනතා සම්මාන උළෙලේදී ‘වසරේ ආහාර සන්නාමය’ ලෙසින් පිළිවෙලින් සිව්වැනි වරටත් සම්මානයට පාත්‍ර විය.